**බැංකු පනත් නියෝගය 2018 අංක 01** 2018 මාර්තු 14

# බැංකු (අක්වෙරළ බැංකු කටයුතු පටිපාටිය) නියෝගය

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 23, 25 සහ 26 යන වගන්තීන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව නිකුත් කරන ලද නියෝගය.

1. උපුටා දැක්වීම — මෙම නියෝගය 2018 අංක 01 දරන බැංකු පනත් නියෝගය වේ.

2. 2000 අප්‍රේල් මස 7 වන දින නිකුත් කරන ලද බැංකු (අක්වෙරළ බැංකු කටයුතු) නියෝගයෙහි 5 වන වගන්තිය සංශෝධනය කිරීම — පහත සඳහන් නව වගන්තිය මගින් අක්වෙරළ බැංකු කටයුතු පටිපාටිය පිළිබඳව 2000 අප්‍රේල් මස 7 වන දින නිකුත් කරන ලද නියෝගයෙහි 5 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කෙරේ.

   අනේවාසික ගිණුමක අවසරලත් ගනුදෙනු — 5. අක්වෙරළ ඒකකයක අනේවාසිකයකු විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුමක නියම කර ඇති ඕනෑම විදේශ මුදල් ඒකකයක් මගින් සිදුවන:

   (a) ප්‍රේෂණ ලැබීම් බැර කළ යුතුය

   (b) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි විධිවිධානයන්ට අනුකූලව අනුමත කර ඇති ගනුදෙනු සුදුසු පරිදි හර හෝ බැර කළ යුතුය.

3. අහෝසි කිරීම් — පහත සඳහන් විධානයන් මෙයින් අහෝසි කෙරේ.

   (i) බැංකු පනත යටතේ නිකුත් කරන ලද, 2009 නියෝග අංක 01 දරන බැංකු (අක්වෙරළ බැංකු කටයුතු පටිපාටිය) නියෝගය.

   (ii) බැංකු පනත යටතේ නිකුත් කරන ලද, 2011 අංක 02 දරන බැංකු (අක්වෙරළ බැංකු කටයුතු පටිපාටිය) නියෝගය.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**